**මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සභාව සම්බන්ධ නඩු කටයුතු 28 ක් ක්‍රියාත්මක වී තිබුණ ද, ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව | නඩු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් රු.380,960 ක තැන්නේකුඹුර ගාලේවත්ත සුසාන භූමියට අයත් ඉඩම, වටිනාකම හඳුනාගත නොහැකි බල ප්‍රදේශයේ පිහිටි ඉඩම් හා ගොඩනැගිලි 03 ක් හා පෞද්ගලික සමාගමක් මඟින් පොදු කටයුතු සඳහා වෙන් කළ රු.100,000 ක පිච්චමල්වත්ත ඉඩම ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ගන්නා බව | ඉඩම් ගොඩනැගිලි හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැය කර තිබුණු රු.1,560,529 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ගන්නා බව | ඉදිකිරීම් පිරිවැය ගිණුම්ගත කළ යුතුය |
| (ඇ) | පරිසර අධිකාරියේ අනුමැතිය තවමත් ලැබී නොමැති කසළ කළමනාකරණයට ඉඩමක් මිලදී ගැනීම සඳහා රු.26,000,000 ක වටිනාකමක් ණයහිමි යටතේ වසර 04 ක් තිස්සේ ගිණුම්වල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරන බව | ගිණුම් නිවැරදි කළ යුතුය |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායම රු.210,350 ක්, උසාවි දඩ රු.628,022 ක් හා ප්‍රාග්ධන ආදායම රු.139,000 ක් ආදායම් හා වියදම් ගිණුමෙහි දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී ගිණුම් සටහන් මඟින් ගැලපීමට කටයුතු කරන බව | ආදායම් ගිණුම්ගත කළ යුතුය |

1.6.3 **නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | **විෂයය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයයන් 03 ක් හා වගකීම් විෂයයකට අදාළ ශේෂයන් සමඟ ඊට අදාළ උපලේඛන හා ලේඛන අනුව ශේෂයන් සමඟ සැසඳීමේ දී, රු.10,565,967 ක නොසැසඳීමක් විය. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ගන්නා බව | වෙනස්කම් හඳුනා ගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් ආදායම් ගිණුම අනුව, රු.17,738,021 ක් වූ අතර, පද්ධති මෘදුකාංගය අනුව ලැබිය යුතු වරිපනම් වටිනාකම රු.18,765,312 ක් වූ බැවින්, රු.1,027,291 ක වෙනසක් විය. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ගන්නා බව | වෙනස්කම් හඳුනා ගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව, සභාව සතු පුස්තකාල 02 ක පොත් වටිනාකම රු.4,584,107 ක් වුවත්, ගිණුම් අනුව එය රු.4,310,027 ක් වූයෙන් රු.273,080 ක වෙනසක් විය. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ගන්නා බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |
| (ඈ) | නාගරික සංවර්ධන අධිකාරී ආයෝජන ගිණුම් ශේෂය රු.11,625,544 ක් හා නාගරික සංවර්ධන තැන්පතු ගිණුම් ශේෂය රු.14,067,336 ක් වූ අතර, රු.2,441,792 ක වෙනසක් විය. | මෙම වෙනස සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර එය නිවැරදි කිරිමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |

1.6.4 **අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| **අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අනුමැතියකින් තොරව දෛනික පදනම මත සේවකයින් 07 දෙනෙකු බඳවා ගෙන 2022 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා රු.1,948,156 ක වැටුප් ගෙවා තිබුණි. | මෙම බඳවා ගැනීම් සඳහා පළාත් පාලන සහාකාර කොමසාරිස් මඟින් පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා දී නැත. එබැවින් ආයතනයේ පවතින සේවා අවශ්‍යතාවය මත මෙම සේවක මහතා සේවයේ යොදවා ගෙන ඇති බව | අනුමැතිය මත බඳවා ගැනීම් කළ යුතුය |

1.6.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.2,367,728ක ණයගැති ශේෂයට අදාළ උපලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා, විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මෙම ශේෂය පිළිබඳව පරීක්ෂා කර බලා නිවැරදි තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ සනාථ කර ගැනීමට අවශ්‍ය ලේඛන පවත්වා ගත යුතුය |

1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 127 වගන්තිය | සභාව සතු සුසාන භූමි 08 ක් පමණක් හඳුනා ගෙන තිබුණු අතර, ඒවා ද ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කොට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු සුසාන භූමි සම්බන්ධ තොරතුරු වත්කම් ලේඛනයට ඇතුළත් කර ඇති අතර, ගැසට් කිරීමෙන් පසු පවරා ගන්නා බව | සභාව සතු සුසාන භූමි පවරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ii) | 154(1) වගන්තිය | පිච්චමල්වත්ත නමැති ඉඩමේ සැලැසුම් අනුමත කර 2022 පෙබරවාරි 29 දින අනුකූලතා සහතිකය නිකුත් කර ඇතත්, සියයට 01 ක ආදායම රු.2,864,983 ක් ලබා ගෙන නොතිබුණි. | මේ පිළිබඳව අදාළ ආයතනය වෙත දන්වා අදාළ මුදල අය කර ගැනීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මුදල් රෙගුලාසි 104(4) | 2017 – 2020 කාලය තුළ අවස්ථා 05 කදී සභාවට අයත් වාහන 03 ක රු.1,672,654 ක අලාභහානි සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අවසාන වාර්තාවක් ලබා ගැනීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ නමුත්, මේ වන තෙක් අදාළ වාර්තාව ලැබී නොමැති බැවින්, ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ඇ) | 1988 අගෝස්තු 23 දිනැති අංක 520/07 දරන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කෙරෙන දැන්වීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ආයතන 17 ක දැන්වීම් පුවරු 50 කින් රු.260,400 ක් අය කර නොතිබුණි. | අදාළ ආයතන වෙත ලිඛිතව ලිපි යවා ඉදිරියේ දී හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | වාර්ෂිකව දැන්වීම් පුවරු සමීක්ෂණය කර ආදායම අය කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති හා අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 IV ඡේදය | පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයේ හෝ පැමිණීමේ ලේඛනයේ පිටවීම අනුව සනාථ කර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 07 කට රු. 460,000 ක සැලැසුම් කම්ටු දීමනා ගෙවා තිබුණි. | ප.ව.4.15 ට පිටවීම සහතික කල පසු නැවත ඇගිලි සලකුණු යන්ත්‍රයෙහි හෝ කාර්යාල පැමිණීමේ ලේඛණයෙහි අත්සන නොතබන අතර, පිටවීම කම්ටු අත්සන් පොතෙහි තබනු ලබන බවත් කම්ටු සටහන් පොත සහතික කර කම්ටු දීමනා ගෙවනු ලබන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.83,770,465 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,020,107 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස් කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස් කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| **(i)** | වරිපනම් හා බදු | 27,214,820 | 26,089,341 | 26,922,888 | 17,753,093 | 27,198,656 | 26,369,005 | 22,267,926 | 18,586,640 |
| **(ii)** | කුලී | 1,117,932 | 2,124,463 | 2,181,263 | -- | 696,332 | 855,600 | 2,056,988 | 56,800 |
| **(iii)** | බලපත්‍ර ගාස්තු | 2,215,750 | 2,409,812 | 7,566,885 | 58,249 | 3,643,720 | -- | 9,667,982 | 5,215,322 |
| **(iv)** | වෙනත් ආදායම් | 128,011,372 | 112,908,692 | 127,782,436 | 141,781,336 | 79,367,000 | 17,385,087 | 122,521,595 | 156,655,080 |
| | එකතුව | 158,559,874 | 143,532,308 | 164,453,472 | 159,592,678 | 110,905,708 | 44,609,692 | 156,514,492 | 180,513,842 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි රු.17,738,021 ක වරිපනම් ශේෂය තුළ රු.5,000 ඉක්ම වූ දේපළ ඒකක 477 ක හිඟය රු.4,481,843 ක් විය. | ජංගම සේවා පවත්වමින් වරිපනම් හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කර වාර්ෂික බිල් කිරීමෙන් සියයට 75 කට වැඩි ප්‍රතිශතයක ආදායමක් උපයා ඇති බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,917,536 ක් හා මුද්දර ගාස්තු රු.119,305,596 ක් විය. | උසාවි දඩවල හිඟයක් නොමැති බව හා මුද්දර ගාස්තු අය කර ගැනිම සඳහා අදාළ ආයතන දැනුවත් කර ඇති බව | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

2.3 **අධිභාර**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂය තුළ දී, රු.262,608 ක අධිභාරයක් පනවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට එම මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ සභිකවරුන්ට මෙම මුදල ගෙවන ලෙස දන්වා ලිපි යවා ඇතත්, මෙතෙක් කිසිදු මුදලක් ගෙවා නැති බව | පනතේ විධිවිධාන අනුව අධිභාර අය කළ යුතුය |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2022 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොමැති බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභා බල ප්‍රදේශයේ මාසිකව එකතු වන කසල ප්‍රමාණය ටොන් 144 ක් වන අතර, සභාවේ ට්‍රැක්ටර් හා සේවකයින් යොදවා එකතු කර දිරන කසල කුණ්ඩසාලේ සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයටත් නොදිරන කසල අකුරණ ප්‍රාදේශීය සභාවටත් භාර දීම සිදු කෙරෙන අතර කාබනික පොහොර නිපදවීම හා ආදායම් ප්‍රවර්ධනය කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | කාබනික පොහොර නිපදවීමට ඉඩමක් නොමැති බව මෙයට හේතු වී ඇති බව | අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගත යුතුය |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178 අනුව, ටෙන්ඩර් පරිපාටියෙන් තොරව පේරාදෙණිය - කොළඹ පාරේ කඩ කාමර 05 ක් වසර 40 කට වැඩි කාලයක් දිගින් දිගටම එකම පුද්ගලයින්ට බද්දට දී තිබුණි. එසේම, බදුකරුවන් කඩ පිටුපස අනවසර ඉදිකිරීම් ද සිදු කර තිබුණි. | 2023 වර්ෂය සඳහා ලබාගන්නා ලද නව තක්සේරුව අනුව කඩ ටෙන්ඩර් කිරීමට කටයුතු කිරීමේ දී, කඩහිමියන් පැමිණිලි කර ඇත. ඒ අනුව, පැමිණිල්ල විමර්ශනය කරන තෙක් 2023.12.31 දින දක්වා නව තක්සේරුව අනුව කඩ කාමර හිමියන්ගෙන් මාසික කුලී මුදල් අයකරනු ලබන බව | ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර කඩ කාමර පැවරිය යුතු අතර, අනවසර ඉදිකිරීම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතුව රු.20,548,004 ක් විය. ඉන් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයකට අදාළ ශේෂ එකතුව රු.3,643,032 ක් හා වසර 05 ක කාලයක් ඉක්ම වූ ශේෂය රු.16,727,747 ක් විය. | මෙම ශේෂ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කර විගණනයට වාර්තා කරන බව | ලැබිය යුතු ශේෂ අය කර ගත යුතුය |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට පැවති ණයහිමි ශේෂ 02 ක එකතුව රු.82,626,910 ක් විය. ඉන් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයකට අදාළ ශේෂවල එකතුව රු.50,051,100 ක් හා වසර 05 ඉක්ම වූ ශේෂය රු.5,539,639 ක් විය. | මෙම ශේෂ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කර විගණනයට වාර්තා කරන බව | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය |
| (ඇ) | 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ රු.13,915,000 ක ගිවිසුම්ගත වීමක් නොකළ ව්‍යාපෘති 57 ක් දිගින් දිගටම ණයහිමි ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අමුද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාම හා සිමෙන්ති හිඟය නිසා, ඉටු කිරීමට නොහැකි වූ බව | ගිවිසුම්ගත වූ හෝ බැඳීම් ඇති කර ගත් කාර්යයන් සඳහා ණයහිමි කළ යුතුය |

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 22 ප්‍රකාරව, ප්‍රජා හා විනෝද කටයුතු සඳහා සුදුසු ස්ථානවලින් වෙන් කර ගත යුතු බව දක්වා ඇතත්, පිච්චමල්වත්ත අනුබෙදුම් ඉඩමේ පොදු කටයුතු සඳහා යොදාගත නොහැකි බෑවුම් සහිත අංක 41 දරන කොටසේ පර්චස් 37.3 ක් හා 42 දරන කොටස් 37.9 ක ප්‍රමාණයක් සභාවට පවරා ගෙන තිබුණි. | මේ පිළිබඳව කරුණු සොයා බලා විගණනයට වාර්තා කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව සුදුසු ඉඩම් වෙන් කරවා ගත යුතුය |
| (ආ) | පසුගිය වර්ෂ 05 ක ගොඩනැගිලි 1456 ක් ලැබී තිබුණු අතර, ඉන් සංවර්ධන බලපත්‍ර 1,200 ක් අනුමත කර තිබුණි. අනුකූලතා සහතික 1052 ක් නිකුත් කර නොතිබුණු අතර, අනුමත නොවුණු අයදුම්පත්‍ර සම්බන්ධව පසු විපරම් කිරිමක් සිදු කර නොතිබුණි. | රටේ පැවති කොවිඩ් වසංගතය හා ආර්ථික තත්වය මත බොහෝ අය කාලය වසර 03 ට වැඩි ප්‍රමාණයකින් ඉල්ලුම් කර දීර්ඝ කිරීම සිදු කර ඇති බව, 2021 හා 2022 වර්ෂවල මෙතෙක් වසර 03 ක් පසු වී නොමැති බැවින්, ඒ සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කර ඇති බව | අනුකූලතා සහතික නිකුත් කළ යුතු අතර, පසු විපරම් කටයුතු සිදු කළ යුතුය |

3.4 **වත්කම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සභාව පරිහරණය කරන රු.27,587,123 ඉඩම් 10 ක් හා වටිනාකම ගණනය කර නොමැති ඉඩම් 05 ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | මේ වන විට සමීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර, වටිනාකම තහවුරු කර විගණනට තොරතුරු ඉදිරිපත් කරන බව | ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | එකතුව රු.1,462,251 ක කම්පැක්ටර් ට්‍රේලරයක් හා ජල උපකරණ ඒකක 171 ක් වසර 05 ක කාලයක සිට නිෂ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි. | කම්පැක්ටර් ට්‍රේලරය අක්‍රීය බවත්, ජල උපකරණ වෙන්දේසිය සඳහා නැවත නිකුත් කරන බව | අලුත්වැඩියා කළ හැකි රථ වාහන අලුත්වැඩියා කිරීමට හා අනෙක් වාහන අපහරණය කළ යුතුය |
| (ඇ) | සභා බල ප්‍රදේශයේ පැවති ඉඩම් වෙන්දේසිවලින් පොදු කටයුතු සඳහා පවරා ගත් වටිනාකම රු.20,903,251 ක් වූ ඉඩම් කොටස් 09 ක් හා වටිනාකම ගණනය කර නොමැති ඉඩම් කොටස් 05 ක් ලෙස මුලු ප්‍රමාණය අක්කර 06 රූඩ් 03 හා පර්චස් 32 ක් වූ ඉඩම් කොටස් 14 ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. | ඉදිරියේ දී පොදු අවශ්‍යතා සඳහා භාවිතයට ගැනීමට කටයුතු කරනු ලබන බව | ඉඩම් පොදු කටයුතු සඳහා උපයෝජනය කළ යුතුය |

### 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ජූලි 11 වන දින රු.1,132,000 ක් වැය කර රු.1,970 ක් බැගින් වොට් 20 ඔරේන්ජ් වර්ගයේ ප්‍රතිදීප්ත (LED) විදුලි පහන් 600 ක් මිලදී ගෙන තිබුණි. මිලදී ගෙන තිබුණු විදුලි උපකරණවලට අදාළ ලිපිගොනුව පරික්ෂාවේ දී, මිල ගණන් කැඳ වූ බවට සාක්ෂි ඉදිරිපත් නොවුණු අතර, ප්‍රසම්පාදන හා තාක්ෂණික කමිටු වාර්තාවකින් තොරව මිලදී ගැනීම් සිදු කර තිබුණි. විගණනය විසින් ඉහත විදුලි පහන් මිලදී ගත් ආයතනයෙන් 2023 අප්‍රේල් 27 දින ලබා ගත් මිල ගණන් අනුව වසර 02 ක වගකීම සහිත වොට් 20 ප්‍රතිදීප්ත (LED )විදුලි පහනක (බල්බ) මිල රු.1,650 ක් බව නිරීක්ෂණය වූයෙන්, අසාමාන්‍ය මිල ගණන් ලබා ගෙන රු.402,000 ක පාඩුවක් සභා අරමුදලට සිදු කර තිබුණි. ඒ ආකාරයෙන් 2023 මාර්තු 23 දින එකතුව රු.1,200,000 ක් වැය කර රු.2,000 ක් බැගින් විදුලි පහන් 600 ක් මිලට ගෙන තිබුණි. | මිලදී ගැනීම් සිදු කිරීමේ දී, ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික කමිටු වාර්තා ලබා ගන්නා බව | මේ පිළිබඳ පරීක්ෂාවක් සිදු කර විගණනයට වාර්තා කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේ දී, පුරප්පාඩු තනතුරු 03 ක් සහ සේවක අතිරික්ත 12 ක් පැවතුණි. | සංවර්ධන නිලධාරීන් 12 දෙනෙකු මෙම කාර්යාලයට අනුයුක්ත කර ඇති බැවින්, එම ප්‍රමාණය අතිරික්ත බව හා පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කර ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතු අතර, තනතුරු අනුමත කර ගත යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු, විශ්‍රාමික හා සේවය හැර ගිය නිලධාරීන් 31 දෙනෙකුගෙන් රු.1,927,922 ක සේවක ණය අය කර ගෙන නොතිබුණි. | ස්ථාන මාරු ලද නිලධාරීන්ගේ ණය ශේෂ පිළිබඳව අදාළ ආයතන දැනුවත් කර ඇති අතර, මෙතෙක් ණය ශේෂ නිරවුල් කර නොමැති බව | සේවක ණය අය කර ගත යුතුය |
| (ඇ) | තනතරු අනුමත කර නොගෙන දෛනික පදනම මත බවා ගත් සේවකයින් 07 කගේ අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවීම යනුවෙන් දක්වා අවකරණය කර ගත් රු.448,071 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | මෙම සේවකයින් බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීමට නොහැකි වී ඇති බැවින්, අර්ථසාධක අරමුදල් පනත අනුව, දායකත්ත්ව අය කර යැවීමට නොහැකි වී ඇති බව | කඩිනමින් නිරවුල් කළ යුතුය.අනියම් හා තාවකාලික සේවකයින්ට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා දිය යුතුය. |